# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2459/22 - 2025 ඔක්තෝබර් මස 22 වැනි බදාදා - 2025.10.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**මැතිවරණ කොට්ඨාස අංක 18 - පොළොන්නරුව**

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසය සඳහා 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 9(3) උප වගන්තිය යටතේ 2021 අප්‍රේල් මස 29 දිනැති අංක 2225/42 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* හා සම්බන්ධිතව නිවේදනය පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

01. එකී *ගැසට්* පත්‍රයේ පළමු ඡේදයේ සඳහන් " ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයෙහි පිහිටි අංක 1757/18 සහ 2012 .05.11 දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළ කරන ලද දැන්වීම ප්‍රකාර බෙදා වෙන් කරන ලද **'ඇ' අක්ෂරය දරන ඡන්ද ප්‍රදේශය** නැවත බෙදා වෙන් කරන්නට යෙදුන බවත් " යන වචන වෙනුවට "ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයෙහි පිහිටි අංක 1757/18 සහ 2012.05.11 දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළ කරන ලද දැන්වීම ප්‍රකාර බෙදා වෙන් කරන ලද **'ආ' අක්ෂරය දරන ඡන්ද ප්‍රදේශය** නැවත බෙදා වෙන් කරන්නට යෙදුන බවත්" යන වචන ආදේශ කිරීමෙන්; හා එකී උප ලේඛනයේ **"ඡන්ද ප්‍රදේශය 'ඇ'- පොළොන්නරුව"** යන වචන වෙනුවට **" ඡන්ද ප්‍රදේශය 'ආ'- මැදිරිගිරිය"** යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම *අති විශෙෂ ගැසට්* නිවේදනය 2021 අප්‍රේල් මස 29 දින සිට ක්‍රියාත්මක විය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**මනෝජ් ටී. ගුරුසිංහ,**
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 18 - පොළොන්නරුව.

2025 ක් වූ ඔක්තෝබර් මස 22 දින,
මැතිවරණ කාර්යාලය,
පොළොන්නරුව.

EOG 10 - 0224

1A - G 45651 — 38 (2025/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*